# ශ්‍රී ලංකාවේ රබර් භාණ්ඩ නිෂ්පාදනය

ස්වාභාවික අමු රබර් නිපදවන ප්‍රධාන රටක් හැටියට ශ්‍රී ලංකාව ලොව පුරා ප්‍රසිද්ධ ය. රබර් අපනයනයන් ගෙන් ශ්‍රී ලංකාව රුපියල් මිලියන 889 ක් උපයා ඇති බවත්, එයිනුත් රබර් නිෂ්පාදනවලින් ලැබුණු මුදල රුපියල් මිලියන 2.8 ක් පමණක් බවත් 1976 වර්ෂයේ රේගු වාර්තා වලින් පෙනෙයි. මෙම රුපියල් මිලියන 2.8 ලැබුණේ කුමන භාණ්ඩ සඳහා කෙතරම් ප්‍රමාණ වලින් දැයි විමසා බැලුවහොත්, ටයර් සඳහා රුපියල් මිලියන 0.8 ක් ද, වල්කනයිස් කළ රබර් සඳහා රුපියල් මිලියන 1.6 ක් ද සහ කිරි නිෂ්පාදන සඳහා රුපියල් මිලියන 0.4 ක් ද යනුවෙනි, ඒ. රබර් පාවහන් වලින් ලැබුණු මුදල ඉහතින් දක්වූ සංඛ්‍යාවට අඩංගු වී නොමැත. එයද එක් වූ විට මුලු මුදල රුපියල් මිලියන 10 ක් පමණ වනු ඇත. අපනයනය කළ රබර් නිෂ්පාදන යන්ගේ අගය රුපියල් මිලියන 15 ට අඩු වුව ද, ශ්‍රී ලංකාවේ උසස් රබර් නිෂ්පාදන කර්මාන්තයක් නොමැත්තේ යැයි වැරදි නිගමනයකට එළැඹිය යුතු නැත. අගය රුපියල් මිලියන 225 ක් වන තරම රබර් නිෂ්පාදන දැනට ශ්‍රී ලංකාවේ නිපැදේ. පසු ගිය 20 වසර තුළ රබර් නිෂ්පාදනයන් පුළුල් වී දැන් අපට සෑහෙන තරම් එම නිෂ්පාදන ඇත. ආනයනය කරන ද්‍රව්‍ය වෙනුවට මේවා යොදා ගැනීමට හැකි වීම නිසා වැදගත් මෙහෙයක් ඉටු වී තිබෙන බව පෙනේ. එහෙත්, රබර් නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අනාගතයේ දී අපට යෝධ පියවරක් ගත හැකි වේවි ද යන්න සැක සහිත ය. නිෂ්පාදන ප්‍රමාණයෙන් සියයට දහයක් පමණ අපනයනය සඳහා වෙන් කළ හැකි බව පිළිගෙන තිබේ. මේ අනුව අපනයනය කළ හැකි රබර් නිෂ්පාදන සම්බන්ධයෙන් අපගේ වර්තමාන ඉලක්කය රුපියල් මිලියන 22.5 කි. ඉටු කර ගතහොත් මෙය ලොකු ජයග්‍රහණයකි.

රුපියල් මිලියන 3,000 ක පමණ රබර් භාණ්ඩ නිපදවන ඉන්දියාවට එම භාණ්ඩ සඳහා තම රටේම විශාල අලෙවියක් ඇත. එහි රබර් කර්මාන්තය ද දියුණු ය. එහෙත් ඉන්දියාව විසින් අපනයනය කරන රබර් නිෂ්පාදනවල වටිනාකම රුපියල් මිලියන 200 ක් පමණි. 1976 දී ඉන්දියාවට රබර් අතිරික්තයක් තිබුණි. එහෙත් ඉන්දියාව පිට රට යැවූයේ රබර් නිෂ්පාදන නොව අමු රබර් පමණි. දියුණු වෙමින් පවත්නා රටවලින් අපනයනය සඳහා නිපැදෙන රබර් භාණ්ඩවල අනාගතය අඳුරු බව මෙයින් පෙනේ.

රබර් වැඩි වශයෙන්ම පරිභෝජනය වනුයේ කුමන නිෂ්පාදනයට ද ? අපනයනය කිරීම සඳහා එම නිෂ්පාදන නිපැද විය හැකි තත්ත්වයක ශ්‍රී ලංකාව සිටින්නේ ද ? බොහෝ සෙයින් අදාල ප්‍රශ්න දෙකකි මේ. අප රටෙහි පරිභෝජනය වන ස්වාභාවික රබර් ප්‍රමාණයෙන් (එනම්, ටොන් 7,000 න්) සියයට හැටක්ම යෙදෙනුයේ ප්‍රවාහණයට අදාල නිෂ්පාදනයන් සඳහා ය. එයින් ටොන් 2,500 ක් අළුත් මෝටර් වාහන ටයර් හා ටියුබ් සඳහා ද ටොන් 1,500 ක් ටයර් යළි තැනීම සඳහා ද, ටොන් 600 ක් බයිසිකල් ටයර් හා ටියුබ් සඳහා වේ. ලෝක රබර් පරිභෝජනය සම්බන්ධයෙන් ද මෙය සැබෑ ය. එනම්, ලෝකයේ ද ස්වාභාවික රබර් වලින් සියයට හැටක් ටයර් සඳහා භාවිතා වේ. පර්යේෂණ හා සංවර්ධන නිසා වසරින් වසර වෙනස් වෙමින් පවත්නා මෙම ටයර් කර්මාන්තය බොහෝ දුරටම පාහේ බහුජාතික සංස්ථාවල ඒකාධිකාරයට යටත්ව පවතී. රබර් නිෂ්පාදන කර්මාන්තයෙහි සැහෙන දියුණුවක් ලබා සිටින ඉන්දියාවෙහි ටයර් සඳහා බහුජාතික සංස්ථා කිහිපයක්ම ඇත. ටයර් නිෂ්පාදනයට අවශ්‍ය වෙනත් අමුද්‍රව්‍යයන් වන කාබන් කුඩු, ත්වරක, ප්‍රතිඔක්සිකාරක සහ ටයර් රැහැන් ආදිය ද එහි නිපැදේ. ශ්‍රී ලංකාව එවැනි දෑ නිෂ්පාදනය කරන්නේ නැත. 1976 දී ඉන්දියාවට තිබූ අතිරික්ත ස්වාභාවික රබර් ප්‍රමාණය අපනයනය කරන ලද්දේ අමු ද්‍රව්‍යයක් හැටියට ය. තමන්ට දියුණු ටයර් කර්මාන්තයක් තිබුණ ද, එම අතිරික්ත රබර් ප්‍රමාණය ටයර් ලෙසින් අලෙවි කර ගැනීමට ඉන්දියාවට නොහැකි විය. ඉන්දියාවෙන් අපනයනය කැරෙන රබර් සඳහා බද්දක් අය කරන්නේ නැත. එහෙත් මලයාසියාවේ හා ශ්‍රී ලංකාවේ එවැනි බද්දක් අය කරනු ලැබේ. එමෙන්ම එම දෙරට තම රබර් නිෂ්පාදන කර්මාන්තයන් නඟා සිටුවීමට උනන්දුවක් දක්වයි. මලයාසියාවේ රබර් මිල අඩු වුව ද, තනිකරම අපනයන සඳහා එහි ටයර් කම්හලක් පිහිටුවීම වාසිදයක නොවේ. ඊට හේතුව නිෂ්පාදිත ද්‍රව්‍යය සඳහා වන අධික ප්‍රවාහණ ගාස්තුවයි. එහෙත් දේශීය නිෂ්පාදකයාට අඩු මිලකට රබර් ලබා ගත හැකි වීමෙන් සිදුවන වාසිය නම්, ආනයනය කැරෙන පිරවුම් ද්‍රව්‍ය හා වෙනත් මිශ්‍රණ ද්‍රව්‍ය සඳහා වන අතිරේක ප්‍රවාහණ ගාස්තු හිලව් කිරීමට තරම් සැහෙන මුදලක් මිළ අඩු රබර් නිසා ඉතිරි වීමයි.

අත්වැසුම් හා රබර් පටි නිෂ්පාදනය නැඟී සිටිය හැකි ව්‍යාපාර බව පෙනේ. එබැවින් දියුණු රටවලට අපනයනය කිරීම සඳහා ස්වාභාවික රබර් උපදින රටවලින් නිපැදවිය යුත්තේ එවැනි භාණ්ඩයන් ය. අත්වැසුම් නිෂ්පාදනය නැඟී සිටිනු ඇත්තේ කේන්ද්‍රාපසාරිකෘත කිරි ලෝක තරඟකාරී මිළකට ලබා ගත හැකි නම් පමණි. එම කිරි ද පෙරාතුව වල්කනයිස් කර තිබුණොත් වඩා හොඳ ය. කේන්ද්‍රාපසාරිකෘත කිරි එම මිළ ගණන් වලට නිපැදවීමට නම් කේන්ද්‍රාපසාරක යන්ත්‍ර අඩු වශයෙන් හතරක්වත් එකට තිබිය යුතු ය. රාජ්‍ය රබර් නිෂ්පාදන සංස්ථාව මේ සඳහා කටයුතු කරගෙන යයි. විශාල වශයෙන් ශ්‍රී ලංකාවට ආනයනය කැරෙන රබර්වල ගිල්වූ භාණ්ඩ වනුයේ වසරකට ශල්‍ය වෛද්‍ය අත්වැසුම් යුගල් 2,00,000 ක් සහ වෙනත් රෝග නිවාරණ උපකරණයන් ය. මේ සඳහා වසරකට වියදම රුපියල් මිලියන 0.75 කි. රටේ පාවිච්චියට හා අපනයනය කිරීම සඳහා විදේශීය සහයෝගය ඇතිව මෙම භාණ්ඩ ශ්‍රී ලංකාවෙහිම නිපැදවීම යෝග්‍ය ය. අපනයනය සඳහා සැහෙන තත්ත්වයකින් යුතුව එම භාණ්ඩ නිපදවන ඉන්දියාව මෙයට හවුල් කර ගත හැක.

රබර් පටි ගැන ද සලකා බැලිය යුතු ය. මේ සඳහා වසරකට ටොන් කිහිප දහසක ලෝක ඉල්ලුමක් ඇත. අපනයනය කිරීමේ අරමුණෙන් යුතුව රබර් පටි නිපැදවීමට ශ්‍රී ලංකාව සිත යොමු කළ යුතු ය. මලයාසියාව විශාල වශයෙන් රබර් පටි නිෂ්පාදනය කරන අතර ශ්‍රී ලංකාවට ද එම තත්ත්වයට පත් විය හැක. වියැළි රබර් වලට නොව කිරි අවස්ථාවේ තිබෙන රබර් වලට රසායන ද්‍රව්‍ය එකතු කිරීම "සිරිත් ප්‍රකාර සංයෝග කිරීම" යනුවෙන් හැඳින්වෙන අතර එමගින් උපකරණ වලට වැය වෙන මිළ හා නිෂ්පාදනයේ මිළ සැහෙන ලෙස අඩු කර ගත හැක. රබර් පර්යේෂණායතනය තම අවධානය යොමු කර සිටින්නේ සිරිත් ප්‍රකාර සංයුක්ත කළ කිරි භාවිතය සහ අමු රබර් ඉපැද වීමටම ඒක සම්බන්ධ කළ අවසන් නිෂ්පාදනය මගින් රබර් පටි නිෂ්පාදන කිරීම පිළිබඳව ය.

අපනයනය සඳහා නිපැදවිය හැකි තවත් වැදගත් භාණ්ඩ වර්ගයක් නම් රබර් පාවහන් ය. මලයාසියාව විසින් වැඩිම ටොන් ගණනකින් අපනයනය කරන රබර් නිෂ්පාදනය පාවහන් ය. ශ්‍රී ලංකාව ද එසේ කරනු ඇතැයි අපේක්ෂා කැරේ.

එලැවුම් පටි හා සොඩ නළ ද වැදගත් නිෂ්පාදන වේ. විදේශීය සහ-යෝගය ඇතිව මේවා ද රටෙහි පාවිච්චිය හා අපනයනය සඳහා අප නිපැදවිය යුතු ය.

ටයර් හැරුණු විට ස්වාභාවික රබර් වලින් සියයට එකකට වැඩියෙන් පාවිච්චි වන නිෂ්පාදන නම් එලැවුම් පටි, සොඩ නළ, පාවහන් සහ පෙණ රබර් ය. බුමුතුරුණු පිටුපස කොටස් වශයෙන් මීස වෙනත් අන්දමකින් අපනයනය කිරීම සඳහා පෙණ රබර් සුදුසු නොවන්නේ ප්‍රවාහණ ගාස්තු නිසා ය. ඉහත සඳහන් නිෂ්පාදන වලට අමතර අනෙකුත් නිෂ්පාදන සියල්ලටම පාවිච්චි වනුයේ රබර් වලින් සියයට එකකට අඩු ප්‍රමාණයකි. මේ අනුව කාර් එන්ජින් සවිකිරීමට ගන්නා "මවුන්ට්" සඳහා වසරක දී ලෝකයේ ම භාවිත වනුයේ ස්වභාවික රබර් ටොන් 3,000 කටත් අඩු ප්‍රමාණයකි. මේ අනුව ලොවෙහි වසරකට නිපදවෙන ස්වාභාවික රබර් ටොන් මිලියන 3.5 න් කාර් එන්ජින් "මවුන්ට්" වැනි වැදගත් නිෂ්පාදනය කට යෙදෙනුයේ ටොන් 3,000 ක් පමණි. වර්ෂයකට ලෝකයේම ටොන් 10,000 කට 1 බැගින් පාවිච්චියට ගැනෙන මෙවැනි තවත් නිෂ්පාදන සිය ගණනක් ඇත. රබර් භාණ්ඩ අපනයනය සඳහා අප විසින් නුදුරු අනාගතයේ දී යෝධ පියවර ගැනීම එතරම් සුභ නොවන අතර, තරමක් දුරට හෝ කළ හැකි වන්නේ රබර් පාවහන්, රබර්වල ගිල්වූ භාණ්ඩ හා රබර් පටි නිපදවීම පමණකි.

රබර් නිෂ්පාදන දියුණු කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාව වැය කරනුයේ වසරකට රුපියල් මිලියන 0.5 කටත් අඩු මුදල් ප්‍රමාණයකි. සුදුසු තාක්ෂණ ක්‍රම දියුණු කිරීම සඳහා මීළඟ වසර

5 තුළ දී මෙම මුදල අඩු තරමින් වසරකට රුපියල් මිලියන 2 දක්වා වත් වැඩි කළ යුතු ය. නව නිෂ්පාදන හා නව ප්‍රයෝජන එහි ප්‍රතිඵල වනු ඇත. මේ සඳහා අවශ්‍ය වනුයේ විදේශීය විශේෂඥයින් හෝ අනුන්ගේ තාක්ෂණ ක්‍රම නොවේ. අරමුණ ඉටු කර ගැනීම සඳහා මේ රටෙහි ම ඇති තාක්ෂණික හා විද්‍යාත්මක දක්ෂතාවයන්ගෙන් ප්‍රයෝජන ගත හැකිය.

රබර් පර්යේෂණායතනය විසින්
1977 සැප්තැම්බර් මස 19 වැනි දින
ගොවිජන සේවා පර්යේෂණ හා පුහුණු ආයතනයෙහි
පවත්වන ලද
" රබර් නිෂ්පාදන " පිළිබඳ සම්මන්ත්‍රණයේ දී
**එම්. නඩරාජා මහතා**
විසින් කරන ලද දේශනයක් ඇසුරෙන්
සිංහලට සකස් කළේ
**උපාලි කන්නන්ගර**
විසිනි